කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක : 29 (VI)

මගේ අංකය: DMS/A/08/24
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

2009.12. 24

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ
සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත.

**රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් සහ ව්‍යාපෘති සේවකයින්ට ජීවන වියදම් දීමනාව ගෙවීම.**

2006.01.17 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 27 හි 04 වැනි ඡේදය හා 2009.01.06 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 29 (V) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. ජීවන වියදම් දර්ශකයට අනුව ජීවන වියදම් දීමනාවක් හෝ ඒ සමාන දීමනාවක් නොගෙවන්නා වූ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවකයින් සඳහා කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 29 (V) හි 02 ඡේදයේ හි සඳහන් පරිදි ගෙවිය යුතු ජීවන වියදම් දීමනාව 2009.11.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, 2009.11.01 දින සිට මසකට රු. 5250.00ක් වශයෙන් සංශෝධනය කිරීමටත්, 2009 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලට අදාල හිඟ මුදල් ද සමග 2010 ජනවාරි මාසයේ සිට ගෙවීමටත් තීරණය කර ඇත.

03. දෛනික වැටුප් ලබන සේවකයින් සඳහා ඉහත ආකාරයෙන් ම දිනකට රු. 175.00ක් ලෙසට ජීවන වියදම් දීමනාව සංශෝධනය කර මසකට රු. 5250.00ක උපරිමයකට යටත්ව ගෙවිය හැකිය.

04. මෙම සංශෝධන, 2007.04.05 දිනැති අංක 33 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව දීමනා ගෙවනු ලබන විදේශාධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල සේවකයින් සඳහා ද ඉහත 02 ඡේදයේ දක්වා ඇති පරිදි ලබා දිය හැකිය.

05. මෙම චක්‍රලේඛය පිළිබඳ කිසියම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් එල්.පී. ජයම්පති මහතා (දුරකථන අංක 2484640) හෝ සහකාර අධ්‍යක්ෂ දීපාල් සිරිබද්දන මහතා (දුරකථන අංක 2484903) අමතන ලෙස කාරුණිකව දන්වමි.

එස්. අබේසිංහ
වැඩබලන ලේකම්
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

| | | | | |
|---|---|---|---|---|
| පිටපත් :- | 1. | ජනාධිපති ලේකම් | - | කාරුණික දැනගැනීම සඳහා |
| | 2. | අග්‍රාමාත්‍ය ලේකම් | - | - එම - |
| | 3. | විගණකාධිපති | - | - එම - |
| | 4. | අමාත්‍ය මණ්ඩල ලේකම් | - | - එම - |
| | 5. | ලේකම් ජාතික වැටුප් හා සේවකසංඛ්‍යා කොමිෂන් සභාව | - | - එම - |

ac-DMS 29(VI).doc